සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10	ඉස්ලාම් ධර්මය I,II	කාලය நேரம் Time	පැය 03 යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

අමතර කියවීම් කාලය - මිනිත්තු 10
අමතර කියවීම් කාලය ප්‍රශ්න තෝරා ගැනීමටත්, ප්‍රශ්න සංවිධානය කිරීමටත් යොදා ගන්න.

උපදෙස් :

- ❖ සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ අංක 1 සිට 40 දක්වා නිවැරදි හෝ සුදුසු පිළිතුර තෝරා ගන්න.
- ❖ පිළිතුරු පත්‍රයේ පිළිතුරට ගැළපෙන අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

I කොටස

1. අකීදා ක්ෂේත්‍රයේ පින්වරු අන්තර්ගත වනුයේ,
   1) අන්නුබුව්වාත් 2) අස්සම්ඉය්යාත් 3) අර්රූහානිය්යාත් 4) අල් ඉලාහිය්යාත්
2. ආදේශ කිරීමට සමාන කළ හැකි යැයි දේශනා කරන පාපය,
   1) ආඩම්බරය 2) දෙමව්පියන් වේදනාවට පත්කිරීම
   3) පොළිය 4) සලාතය අතහැරීම
3. පිරිසිදු වුව ද අනිකුත් දේ පිරිසිදු කළ නොහැකි ජලය,
   1) අල් මාඋන් තහූර් 2) අල් මාඋල් මුතනජ්ජිස් 3) අල් මාඋන් මුත්ලක් 4) අල් මාඋන් තාහිර්
4. නබි (සල්) තුමා තම අවසන් හෝරාවෙහි වසිය්යත් කළ ඉබාදතය,
   1) සකාත් 2) සලාතය
   3) දික්ර් 4) අල්කුර්ආනය පාරායනය
5. අරාබිකරයේ දක්ෂිණ සීමාව,
   1) සිරියා කාන්තාරය 2) අරාබි මුහුද
   3) පර්සියානු අර්ධද්වීපය 4) රතු මුහුද
6. ''ආමුල් හුස්න්'' සමඟ සබැඳිවනුයේ,
   1) කදීජා (රලි), අබ්දුල් මුත්තලිබ් 2) අබුබක්කර් (රලි), අබ්දුල් මුත්තලිබ්
   3) අබුතාලිබ්, කදීජා (රලි) 4) ආයිෂා (රලි), අබුතාලිබ්
7. අබුබක්කර් (රලි) තුමාගේ සියලු සම්පත් යුද වියදම් සඳහා ලබාදුන් යුද්ධය,
   1) උහද් 2) හන්දත් 3) බද්ර් 4) තබුක්
8. ''ඔබ ඊමාන් නොදරන තෙක් ස්වර්ගයට ප්‍රවේශ නොවේ. අනය්‍යෝන්‍ය ..... දක්වන තෙක් ඊමාන් ද දැරිය නොහැක.'',
   1) උදව් කිරීම 2) ඉවසීම 3) උපදෙස් දීම 4) ආදරය

Past Papers Wiki

9. සාමාන්‍ය නපීසයට අන්තර්ගත නොවනුයේ,

1) ස්වභාවිකව මරණයට පත් වූ මාළු
2) සැරව
3) මත්පැන්
4) මදි

10. ''සැක සහිත දේ අතහරින්න. සැක රහිත දේ පිළිපදින්න.'' යන්න,

1) ඉමාම්වරුන්ගේ ප්‍රකාශයකි
2) අල්කුර්ආන් පාඨයකි
3) හදීසයකි
4) සහභාවරුන්ගේ ප්‍රකාශයකි

11. ''පැවිදිබව'' යන්නෙහි අරාබි පදය,

1) සුහූද්
2) රහ්බානියා
3) වරද
4) ඉහ්ලාස්

12. ධනය හා සම්පත් වලින් අධික යහක්‍රියා කළ සහාබිවරයා ,

1) අබ්දුල්රහ්මාන් බින් අවුෆ් (රලි)
2) බිලාල් ඉබ්නු රබාහ් (රලි)
3) අබුදර් කිෆාරි (රලි)
4) අනස් බින් මාලික් (රලි)

13. වහී පහළ වීම ආරම්භ වූ මාසය,

1) රජබ්
2) රමලාන්
3) දුල්හජ්
4) මුහර්රම්

14. යමාමා යුද්ධයෙහි ඉලක්කගත කණ්ඩායම වනුයේ,

1) ව්‍යාජ නබිවරු, යුදෙව්වන්
2) යුදෙව්වන්, ක්‍රිස්තියානිවරු
3) ක්‍රිස්තියානිවරු, ආගම් මාරුකරන්නන්
4) ව්‍යාජ නබිවරු, ආගම් මාරුකරන්නන්

15. කියාස් හි ''ඉල්ලත්'' යනු,

1) පොදුභාවය
2) විසඳුම් ලබාදුන් ගැටළුව
3) නීතිය
4) විසඳුම් දිය යුතු ගැටළුව

16. ෂෙයිතාන් ආවේශ වී නැගිටින්නන් ..... පාරිභෝජනය කළවුන්ය,

1) සොරකම
2) මුසාව
3) පොළිය
4) අල්ලස

17. ''කාෆාතුන් ලින්නාස්'' යනු,

1) මානව සංහතියටම නබි
2) මුස්ලිම් සමූහයටම නබි
3) සකල විශ්වයෙහිම සම්පත වූ නබි
4) ජනතාවට ආදරය වූ නබි

18. ''හෙරු උම්මත්'' උසස් සමූහය ලෙස හැඳින්වීමට හේතුව,

1) අන්‍යෝන්‍ය උපකාරය
2) දෑවා සේවය
3) සමගියෙන් සිටින සමූහය
4) අනිකාට බාධා නොවන සමූහය

19. ''ප්‍රමුඛතාව ලබාදිය යුතු නීති පද්ධතිය'' වනුයේ,

1) ෆික්හුල් දෑවා
2) ෆික්හුල් අක්ලිය්‍යාත්
3) ෆික්හුල් ඉස්ලාම්
4) ෆික්හුල් අව්ලවියාත්

20. 'අ' සහ 'ආ' සම්බන්ධ කරන්න.

අ	ආ
1) හාබිල්	A ලෝහ තාක්ෂණය
2) කාබිල්	B පේෂ කර්මය
3) දාවූද් (අලෙ)	C බෝග වගාව
4) සකරිය්‍යා (අලි)	D සත්ව පාලනය

1) CDAB
2) DCAB
3) DCBA
4) CDBA

21. ''දිවා කාලයෙහි උපවාස ශීලයත් රාත්‍රිය පුරා සලාත් කිරීමත්'' පිළිබඳව නබිතුමා උපදෙස් ලබාදුන් සහාබිවරයා,

1) අබු හුරෙරා (රලි) 2) ඉබ්නු අබ්බාස් (රලි)
3) අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් (රලි) 4) උස්මාන් (රලි)

22. ''තවක්කුල්'' යන්න,

1) අල්ලාහ්ට බාර කළ පසු පරිපූර්ණ උත්සාහයේ යෙදීම.
2) අල්ලාහ් වෙත ප්‍රාර්ථනාවෙන් යැදීම.
3) පරිපූර්ණ උත්සාහයෙන් පසු ප්‍රතිඵලය අල්ලාහ් වෙත බාර කිරීම.
4) දේවභක්තියෙන් ජීවත්වීම.

23. සිත සහ ධනය සම්බන්ධ ඉබාදතයක් වනුයේ,

1) සකාතුල් ෆිත්රා, ප්‍රාර්ථනාව 2) යහචින්තනය, අකීකා
3) අහංකාරය, උපවාසය 4) උලුහිය්යා, දික්ර්

24. පාරිභෝගිකයා තෘප්තිමත් වී භාණ්ඩය ලබා ගැනීම,

1) හලාල් 2) කබූල් 3) ඊජාබ් 4) මුආමලාත්

25. බුද්ධිය හා සම්බන්ධ වෘත්තියකි,

1) ආරක්ෂක වෘත්තිය 2) ශ්‍රමික වෘත්තිය 3) ලිපිකාර වෘත්තිය 4) ඉගැන්වීම

26. ''ආදරය සම්මිශ්‍රිත බිය'' යන්නෙහි අරාබි පදය,

1) වදූද් 2) ගව්ෆ් 3) රහීම් 4) මහබ්බත්

27. ''මැග්නාකාර්ටා පනත'' සංස්ථාපිත වූ ස්ථානය,

1) එංගලන්තය 2) සවුදි අරාබියාව 3) ඉන්දියාව 4) පලස්තීනය

28. මහ්ෂර් පිටියෙහි සෙවණ ලැබෙන පිරිසක් වනුයේ,

1) රමළාන් මාසයේ රාත්‍රී නැමදුම් කරන්නා
2) දුප්පතාට උපකාර කරන්නා
3) ඉබාදත්හි යෙදුණු තරුණයා
4) කෝපයෙන් යුත් පුද්ගලයන් අතර සාමය පතුරුවන්නා

29. බහුතර තීරණය සබැඳි ඉජ්මාව,

1) ඉජ්මා සුකූති 2) ඉජ්මා අක්සරිය්යා 3) ඉජ්මා සරීහ් 4) ඉජ්මා කව්ලි

30. ''ආයතුල් කුර්ෂ්'' හි අන්තර්ගත අල්ලාහ්ගේ නාමයන්,

1) ජීවමාන ය, මහා කාරුණික ය 2) මැවුම්කරු ය, සමාව දෙන්නා ය
3) ජීවමාන ය, සදාකාලිකයා ය 4) සදාකාලිකයා ය, අසන්නා ය

31. මිහ්රාජයෙන් පසු පිබ්රීල් (අලෙ) නබිතුමාට ඉමාමත් කළ දින ගණන,

1) 02 2) 04 3) 03 4) 05

32. ෆර්ල් අයින් වනුයේ,

1) දෙමව්පියන්ට රැකවරණය ලබාදීම 2) කාන්තා වෛද්‍යවරියන් බිහි කිරීම
3) ආපදාවට ලක්වන්නන්ට උදව් කිරීම 4) පොදු ස්ථාන පිරිසිදුව තබා ගැනීම

33. ''සාලිහ් වූ අමලය'' යන්නට නිවැරදි අර්ථය,

1) යහක්‍රියාවල නිරත වීම 2) රැකියා සඳහා සම්මුඛ වීම
3) සමාජ සේවාවල යෙදීම 4) සුදුසු අවස්ථාවන්හි උචිත ක්‍රියා සිදුකිරීම

34. ''අහ්ලුස්සුන්නා වල් ජමාඅා'' යන්න,

1) කුලඟාඨර් රාෂිදූන්වරු අනුගමනය කරන්නන්

2) නබි (සල්) තුමා සහ සහබාවරුන් අනුගමනය කරන්නන්

3) අල්කුර්ආනය පමණක් අනුගමනය කරන්නන්

4) සහාබාවරු සහ තාබිඊන්වරුන්ව අනුගමනය කරන්නන්

35. නබි (සල්) තුමා ..... යුද්ධයෙන් පසු සියලු කෘෂිකාර්මික ඉඩම් ගොවියන්ට බෙදාදෙන ලදී. එම යුද්ධය,

1) අහ්සාබ් 2) බද්ර් 3) තබුක් 4) කෙබර්

36. 'අ' සහ 'ආ' සම්බන්ධ කරන්න.

1) ඉමාම් අබුල් හසන් අල් අෂ්අරි	A සීරා
2) ඉමාම් ෂාෆිඊ	B අකීදා
3) ඉමාම් ෂිබ්වෙ	C අරාබි ව්‍යාකරණ
4) මුහම්මද් අබ්දුල් මලික් බින් හිෂාම්	D ෆික්හු

1) BDAC 2) DCBA 3) BDCA 4) CADB

37. ''නෆ්සුල් අම්මාරා බිස්සූඃ'' යන්න,

1) තමාව රිදවා ගන්නා සිත 2) තෘප්තිමත් සිත

3) පාරිශුද්ධ සිත 4) අයහපතට පොළඹවන සිත

38. ''සලවාතුල් ඉබ්රාහිමිය්යා'' පාරායණා කරන අවස්ථාව,

1) උපවාසය අත්හැරීමෙන් පසු 2) මාසිකව අඬසඳ දැකීමෙන් පසු

3) සලාතයෙහි අවසාන අත්තහිය්යාත්හි 4) ජනාසාව භූමදානයට රැගෙන යන අවස්ථාවෙහි

39. මාපිද් යන අය අලුයම අවදි වී දේව මෙහෙයන් ඉටුකොට තම වත්තට ගොස් කෘෂිකාර්මික කටයුතුවල යෙදේ. මෙය,

1) ඉබාදත්, ඉමාරත් 2) කිලාඟත්, ඉමාරත් 3) ඉබාදත්,කිලාඟත් 4) ඉමාරත්, ඉබාදත්

40. තයම්මුම් සිදුකිරීමට අවස්ථාව ලබා දී ඇත්තේ,

1) පිට ප්‍රදේශයෙහි තුවාලයක් පැවතීම 2) අවශ්‍යතාවන්ට පමණක් ජලය තිබීම

3) වෙරළාශ්‍රිතව විනෝදයට කාලය ගත කරන අවස්ථාව 4) නැවෙහි ගමන් කරන අවස්ථාවෙහි

(1 × 40 = ලකුණු 40)

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10	ඉස්ලාම් ධර්මය II	කාලය நேரம் Time

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

උපදෙස් :

- **පළමු** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමු** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

(01) 1) මූලික නිශ්චිත ඉබාදත් ඉටුවීමට කොන්දේසි **දෙකක්** ලියන්න.
2) රහස්‍ය දෑවා සහ ආධ්‍යාත්මික පුහුණුව පැවැත්වූ සහාබිවරයාගේ නිවස කුමක් ද?
3) වහී සඳහා භාෂාමය අරුත් **දෙකක්** නම් කරන්න.
4) මුල් කාලීනව අල්කුර්ආනය ලියූ ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න
5) සුන්නත් වූ ඉබාදත් **දෙකක්** ලියන්න.
6) ඉජ්මා, කියාස් හැර සහාය මූලාශ්‍ර **දෙකක්** දක්වන්න.
7) නූතන ලෝකයෙහි ආර්ථික සංකල්ප **දෙක** නම් කරන්න.
8) ලෝහ තාක්ෂණයෙන් යුත් සූරා කහ්ෆ් හි සඳහන් රජු කවුරුන් ද?
9) වෛවාහික බන්දුතාවට නිදසුන් **දෙකක්** දක්වන්න.
10) කෘෂිකාර්මික ඉපැයීම් ක්‍රමයෙහි වර්ග **දෙක** නම් කරන්න.

(2 × 10 = ලකුණු 20)

(02) 1) සුබහ් සලාතයෙන් පසු ''අල්ලාහුම්ම අජිර්නි මිනන්නාර්'' පාරායණයේ ආනිසංස ලියන්න.
2) ඉස්ලාමීය දෑවා හි නබිතුමා මුහුණ දුන් අභියෝග **තුනක්** දක්වන්න.
3) ඉපයීමට අදාළ ෂරිආ නීති **පහක්** විස්තර කරන්න.

(2+3+5 = ලකුණු 10)

(03) 1) ''සීරා'' යන්න විස්තර කරන්න.
2) නබිතුමාගේ සීරාව ආරක්ෂා වීමට හේතු **තුනක්** ලියන්න.
3) ''කියාස් නීති මූලාශ්‍රයකි.'' යන්නට සාක්ෂි **තුනක්** දක්වන්න.

(2+3+5 = ලකුණු 10)

(04) 1) සුන්නාහ් පමණක් ඉදිරිපත් කරනා ඉබාදත් **දෙකක්** ලියන්න.
2) ''වහී හෙරූ මත්ලුවි'' සඳහා උදාහරණ **තුනක්** ලියන්න.
3) ''වහී'' හි වැදගත්කම් **පහක්** පෙළගස්වන්න.

(2+3+5 = ලකුණු 10)

Past Papers Wiki

(05) 1) ස්පාඤ්ඤය සහ කොන්ස්තන්තිනෝපලය ජයගත් නායකයන් **දෙදෙනා** කවුරුන් ද?.

2) ඉස්මාහි ප්‍රයෝජන **තුනක්** ලියන්න.

3) අජ්නබි පුරුෂයන් ආශ්‍රයේ දී අනුගමනය කළ යුතු සීමා **පහක්** ලියන්න.

(2+3+5 = ලකුණු 10)

(06) 1) ඉපයීමේ වැදගත්කම් **දෙකක්** ලියන්න

2) නබිතුමා වෙනුවෙන් පෙනී සිටි තරුණයන් **තිදෙනෙකු** නම් කරන්න.

3) ක්‍රියාකාරකම් සම්බන්ධ ආර්ථික කරුණු **පහක්** ලියන්න.

(2+3+5 = ලකුණු 10)

(07) පහත මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i) මධ්‍යස්ථ බව රැකීම

ii) ඉස්ලාම් ලබාදුන් මානව අයිතිවාසිකම්

iii) සලාතයෙහි වැදගත්කම

iv) ඉහ්ලාස්

(5 + 5 = ලකුණු 10)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library